# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/6 - 2020 ජනවාරි මස 06 වැනි සඳුදා - 2020.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ අංකය. :-කේඩීඑස්/එච්ජ්ආර්/4/2/1/49.*
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමා: යොමු අංකය :-* 4-3/09/2015/ඩබ්ලිව්එස්/131.

මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ උඩුවාවල සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ උඩුවාවල ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙළ කරන ලද අංක 320320 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 02 හි පත්‍ර අංක 01 හි කැබලි අංක 76 ලෙස දැක්වෙන හෙක්ටයාර් 0.0813 ක් පමණ වූ ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක 76
ඉඩමේ නම: උස්කැටේ හේන; හිමිකම් කියන අය: ජේ. ඒ. විමලසේන මයා, අංක 24/ඒ, ගොතටුවේ වත්ත, උඩුවාවල, කටුගස්තොට; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0813.

ඉහත සඳහන් ඉඩමම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020.02.26 දින පෙ.ව.10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020.02.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

මොහාන් ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2020 ජනවාරි මස 03 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-532

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 31757 - 27 (2020/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.